# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2109/29 - 2019 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා - 2019.02.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/15/2016/VE/233.

*මගේ යොමු අංකය* : WAR/LAN/ACQUS/A2/5-67.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 94, බෝපිටිය ග්‍රාම නිලධාරී වසමේ බෝපිටිය ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවට කෑගල්ල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2018.12.29 දිනැතිව පිළියෙල කර ඇති අංක මු.පි.කෑ. 3632හි කැබලි අංක 01 සිට 02 දක්වා පහත විස්තර කරන ඉඩම් කොටස් (02).

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: පල්ලේගමවත්ත (බටුවන කොටස); ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 3.1986.

02. **කැබලි අංක 2**

ඉඩමේ නම: පල්ලේගමවත්ත (බටුවන කොටස); ඉඩමේ විස්තරය: ලඳු කැලය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0301.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.03.21 වැනි දින පෙ.ව. 10.00 ට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2019.03.07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ලක්ෂ්මේන්ද්‍ර දමයන්ත්කුමාර තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
වරකාපොල.

2019 පෙබරවාරි මස 06 වැනි දින,
වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-863